**ශීර්ෂ අංක 229 - නීතිපති දෙපාර්තමේන්තුව**
**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ විගණන මතය
**---------------------------------------**

නීතිපති දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**-----------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම
**-----------------------------------------------------------------------------------------------------------**

**-----**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධි විධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අව ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම් ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතාව පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂයේ ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම**

2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** චක්‍රලේඛයේ 3.1 හා 3.3 ඡේදය ප්‍රකාර මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී එම වත්කම් වටිනාකම සමඟ කේවල වත්කම් වටිනාකම් පරීක්ෂා කර බලා එම වටිනාකම් සැසඳෙන බවට ගණන්දීමේ නිලධාරි තහවුරු කිරීම කළයුතු විය. එහෙත් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම්වල ප්‍රධාන ලෙජර් ශේෂ වටිනාකම ශූන්‍ය අගයක් බව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ප්‍රකාශ කිරීම නිසා චක්‍රලේඛ ප්‍රකාර මූල්‍ය නොවන වත්කම් සැසඳීමක් සිදු වී නොතිබුණි. | සෑම වර්ෂයකම දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ නිවැරදි වාර්තාවක් භාණ්ඩාගාරයට ඉදිරිපත් කර එමඟින් ලබා ගන්නා ප්‍රධාන ලේජර් ශේෂ සමඟ දෙපාර්තමේන්තු ප්‍රධාන ලෙජර් ශේෂ සහ කේවල ශේෂ ලැයිස්තු එකඟ කර ලේඛන පවත්වාගෙන යා යුතුවේ. | මූල්‍ය නොවන වත්කම් වල ප්‍රධාන ලෙජර් ශේෂවල වටිනාකම භාණ්ඩාගාර පොත් සමඟ නොසැසඳේ. එබැවින් 2018 දෙසැම්බර් 31 දින මූල්‍ය නොවන වත්කම් ලෙජරය ශූන්‍ය අගයක් බවට ගිණුම් දෙපාර්තමේන්තුව ප්‍රකාශ කර, නිවැරදිව වත්කම් ඇතුළත් කරන ලෙස දෙන ලද උපදෙස් අනුව වත්කම් සියල්ල නව සිගාස් වැඩසටහනට ඇතුළත් කර ලෙජරය යාවත්කාලීන කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) චක්‍රලේඛයේ 3.4 ඡේදයේ විධි විධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූලා‍ය ප්‍රකාශනවල සටහන් අංක (III) යටතේ වන බැඳීම් හා බැරකම්වල වටිනාකම රු.84,428,666 ක්වූ නමුත් භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබූ බැඳීම් හා බැරකම් පිළිබඳ වාර්තාව ශූන්‍ය අගයක් ගෙන තිබුණි. | දෙපාර්තමේන්තු මූලා‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) යටතේ එක් එක් වැය විෂය සඳහා වන බැරකම් සියල්ල නිවැරදිව හඳුනා ගැනීම සහ එම බැරකම් භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශ සමඟ සැසඳී තිබිය යුතුවේ. | පරිසනක ගත කර තිබූ අදාල බැරකම් වාර්තාව අතපසු වීමකින් මාසික ගිණුම් සාරාංශය සමඟ භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වීම නිසා එකී වාර්තාව ශූන්‍ය අගයක් ගනු ලැබ ඇත. |

## 1.6.2 හිඟ ආදායම

--------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා සංස්ථා අංශය විසින් රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නෛතික ගාස්තු සඳහා බිල් කල වටිනාකම රු.103,197,183 ක් බව හා ඉන් අය කරගෙන තිබුණේ රු.36,549,689 ක් බව විගණනයට වාර්තා කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ හිඟහිටි ආදායම රු.66,647,494 ක් වුවත් මූලා‍ය ප්‍රකාශනවල හිඟහිටි ආදායම රු.66,581,244 ක් ලෙස දක්වා තිබූ නිසා රු.66,250 ක වෙනසක් පැවතුණි. | අය වීමට ඇති ආදායම් ප්‍රමාණය, එකතු කරන ලද ආදායම් ප්‍රමාණය සහ හිඟ ආදායම් කිසිවක් වේ, නම් එම ප්‍රමාණයන් පැහැදිලිව දැක්වෙන අයුරින් ක්‍රමවත්ව වාර්තා පවත්වා ගැනීම කළ යුතුවේ. | හිඟ ආදායම්වල වෙනස ලෙස පෙන්වා ඇති රු.66,250 ක වටිනාකම 2018 වර්ෂයේදී චෙක්පත් අංක 503142 මුදල් අංශයට ලැබී රිසිට්පත් නිකුත් කළ නමුත් අතපසු වීමකින් මුදල් පොතේ සටහන් නොවූ වටිනාකමක් වන අතර එම වරද 2019 වර්ෂයේදී නිවැරදි කර ඇත. |

**1.6.3** බැරකම්

---------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල රු.7,044,183 ක් වූ බැරකම් 2019 ජනවාරි මාසයේදී නිරවුල් කිරීමට කටයුතුකර තිබුණද, එම වටිනාකම් 2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයෙහි බැරකම් හා බැඳීම් යටතේ වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. | එක් එක් වැය විෂයය සඳහා වන බැරකම් සියල්ල නිවැරදිව හඳුනා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේදයන් පවත්වා ගැනීම කළ යුතුවේ. | 2018 වර්ෂයේදී ඉටු කරගත් අත්‍යාවශ්‍ය සේවා වෙනුවෙන් වූ මෙම බිල්පත් ගිණුම් අංශයට ලැබුණේ 2019 වර්ෂයේ තුළ වූ බැවින් 2018 දෙසැම්බර් 31 දින බැරකම් ලේඛනයට ඇතුළත් වී නොමැත. |

## 1.6.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධි විධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාවද ඉදිරිපත් කළ යුතුවේ. | මේ වනවිට වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සනට යොමු කර ඇත. |
| (ආ)2016.03.31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම. | අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර ඉදිරිපත් කළ යුතුවේ. | 2019 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය නිම කර ඇති අතර එම වාර්තාව මේ වනවිට සකස් කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ආදායම් ඇස්තමේන්තු කිරීම, රැස් කිරීම, අධීක්ෂණය හා වාර්තා කිරීම පිළිබඳ සමාලෝචනය විධිමත් පරිදි සිදු කිරීම ආදායම් ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම විය. එහෙත් රු. මිලියන 40 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණු ආදායම් සංකේතයක තථ්‍ය ආදායම රු.මිලියන 64.61 ක් වීම හේතුවෙන් සියයට 62 ක ඉක්මවීමක් නිරීක්ෂණය විය. ඒ අනුව ඇස්තමේන්තු පිළියෙල කිරීම තාත්වික අයුරින් සිදු කර ඇති බවත් නිරීක්ෂණය නොවීය. | ආදායම් ගණන්දීමේ නිලධාරීන් ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ කාර්ය අඛණ්ඩව සමලෝචනය කිරීම , විශ්ලේෂණය කිරීම හා අධීක්ෂණය කිරීම කළයුතු අතර තාත්වික පදනමකින් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | ඇස්තමේන්තු ආදායම් හා තථ්‍ය ආදායම් අතර වෙනසට හේතු වී ඇත්තේ හිඟ ආදායම් රැස් කිරීම වැඩි වී ඇති නිසාය. එම නිසා ආදායම වැඩියෙන් පෙන්වා ඇත. ඔබේ නිර්දේශයට අනුකූලව ඇස්තමේන්තු සකස් කිරීමේ කාර්යය අඛණ්ඩව සමාලෝචනය හා අධීක්ෂණයට යටත්ව වඩාත් තාත්ත්විකව කරගෙන යාමට ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) 2018 වර්ෂය සඳහා බිල් කල මුළු ආදායම රු.මිලියන 103.19 ක් වුවත් සමාලෝචිත වර්ෂය තුළදී අය කරගෙන තිබූ ආදායම රු.මිලියන 36.55 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයට අදාලව අය කර ගැනීමට නොහැකි වූ මුදල රු. මිලියන 66.65 ක්වූ අතර එය සියයට 64.58 ක් විය. කෙසේ වුවද සමස්ථ හිඟහිටි ආදායම රු. මිලියන 259.37 ක් විය. | රජයට අය වියයුතුව තිබෙන ආදායම් කාල පමාවකින් තොරව අය කර ගැනීමට අවශ්‍ය සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කිරීම. | හිඟ ආදායම් සම්බන්ධයෙන් අර්ධ වාර්ෂික වාර්තා අදාල පරිදි විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. රජයට අය වියයුතු ආදායම් කාල පමාවකින් තොරව අය කර ගැනීමට ඉදිරියේදී ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යොදා ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ ii උපලේඛනයේ 1(ආ) යටතේ දැක්වෙන ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් ත්‍රෛමාසික ආදායම් වාර්තාවක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළයුතුව තිබුණද, එකී වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර තිබූ බවට සාක්ෂි නොවීය. | ත්‍රෛමාසික ආදායම් වාර්තා පිළියෙල කර අදාල ආයතන වෙත ඉදිරිපත් කළ යුතුවේ. | අදාල ත්‍රෛමාසික ආදායම් වාර්තා පිළියෙල කර යවා ඇති අතර අදාල ලිපිගොනු විගණනයට ඉදිරිපත් වී නොමැත. මේ වනවිට කාර්ය සාධන වාර්තාව පිළියෙල කර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සනට ඉදිරිපත් කර ඇත. |

## 2.2 වියදම් කළමනාකරණය

--------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------------- |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, තම ඇස්තමේන්තුවට අදාල කෙටුම්පත් ඇස්තමේන්තු රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කරනබවට වගබලා ගැනීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ.<br>නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ සමස්ථ පුනරාවර්තන වැය විෂයයන් 17 කින් වැය විෂයයන් 04 ක් වෙත සලසා තිබුණු රු.මිලියන 6.5 ක ප්‍රතිපාදනය වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 03 ක් වෙත අවස්ථා 03 කදී මාරු කර තිබුණි. එමෙන්ම මූලධන වැය විෂයන් 04 ක් වෙත සලසා තිබුණු රු. මිලියන 35 ක ප්‍රතිපාදනය වෙනත් මූලධන වැය විෂයන් 04 ක් වෙත අවස්ථා 03 කදී මාරු කර තිබුණු අතර පරිපූරක ඇස්තමේන්තු මඟින් රු. මිලියන 469.74 ක අමතර ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසිවල අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය. | සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව පූර්වාණුමාන කලහැකි සියළුම සේවාවන් ඇතුලත් කර සම්පූර්ණයෙන් හා නිවැරදි ලෙස වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම කළ යුතුවේ. | නව චක්‍රලේඛය මඟින් නීති නිලධාරීන්ගේ වැටුප් හා දීමනා වැඩි වීම, නවක කාර්ය මණ්ඩලවල 211 ක් බඳවා ගැනීම හා එමඟින් පුහුණු අවස්ථා වැඩි වීම, ඒ අනුව සංයුක්ත දීමනා, ගමන් වියදම් දීමනාව හා ඉන්ධන දීමනාව වැඩිවීම, අළුත්වැඩියා හා නඩත්තු කටයුතු අනපේක්ෂිත ලෙස පැන නැඟීම හා සේවා ගිවිසුම් අළුත් කිරීමේ අවශ්‍යතාවක් පැන නැඟීම වැනි හේතූන් නිස ප්‍රතිපාදන ඌනතාවය මතු වී ඇත. ඔබේ නිර්දේශයට අනුකූලව නිසි සැලකිල්ලෙන් යුක්තව පූර්ව අනුමාන කළහැකි සියළුම වියදම් ඇතුළත් කර සම්පූර්ණයෙන් නිවැරදි වන ලෙස වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම සම්බන්ධයෙන් |

| | | |
|---|---|---|
| | | අවධානය යොමු කිරීමට කටයුතු යොදා ඇත. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැදීමකට හෝ නොබැදි සිටිය යුතුය. එසේම දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා සලසා තිබූ ප්‍රතිපාදන මුදල් සීමාව නොඉක්ම විය යුතුය. කෙසේ වෙතත් දෙපාර්තමේන්තුවේ වැය විෂයයන් 04 කට අදාලව ප්‍රතිපාදන කර තිබූ මුදල ඉක්මවා රු. මිලියන 3.35 ක බැරකම්වලට එළඹ තිබුණි. | දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන ඇත්නම් විනා වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා වියදමකට හෝ බැදීමකට ඇතුලත් නොවිය යුතු වේ. | 2018 වර්ෂය සඳහා ඉල්ලීම් කරන ලද අයවැය ඇස්තමේන්තුව සංශෝධනය වීම නිසා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ අතර අත්‍යාවශ්‍ය සේවාවන් සපයා ගැනීමේදී අදාල වැය විෂයන්හි ප්‍රතිපාදන ඉක්මවා තිබුණි. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන් හා අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම තුළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත සහ තත්‍ය කාර්ය මණ්ඩලය, ප්‍රමුඛතා<br><br>අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම, ක්‍රියාත්මක කළයුතු කාල රාමුව, අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල සහ ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා යන කරුණු ඇතුළත්ව නොතිබූ බැවින් එම ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර ඇති බවක් නිරීක්ෂණය නොවීය. | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී ඔබගේ නිර්දේශ මඟින් පෙන්වා දී ඇති අඩුපාඩුකම් ඇති නොවන පරිදි 2014 පෙබරවාරි 17 දිනැති අංක 2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සකස් කිරීමට කටයුතු කරමි. |

## 3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් 04 දෙනෙකු සේවයේ යෙදී සිටියද, එම නිලධාරීන් ඇප තැන්පත් කිරීමක් සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 880(1) අනුව රජයේ මුදල් හා මුද්දරභාරව කටයුතු කරන, වවුචර් සහතික කරන හා චෙක්පත් අත්සන් කරන නිලධාරීන් ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතුවේ. | ඇප තැබීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර ඉදිරියේදී ඒ පිළිබඳව නිසි අවධානය යොමු කිරීමට කටයුතු යොදා ඇත. |

## 4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා රජය, රජයේ ආයතන, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය සියළුම නෛතික සේවාවන් හා නීති උපදෙස් නොපමාව සැපයීම මඟින් රජයේ පුළුල් අරමුණු ව්‍යාප්ත කිරීමේ දී සුවිශේෂී කාර්යන් සඳහා දායක වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවලට අදාල මුළු කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 251 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි. | ආයතනයේ අරමුණු හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවලට අදාල කාර්ය මණ්ඩලය බඳවා ගැනීම ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා කටයුතු කිරීම. | විගණනයේදී පෙන්වා දී ඇති පරිදි එම ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු වලට අදාල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කර ඇති අතර මේ වන විට ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා ඇත. |